2025-01

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

**වර්ෂ අවසාන ඇගයීම - 2024 (2025)**
**ஆண்டிறுதி மதிப்பீடு - 2024 (2025)**
**Year End Evaluation - 2024 (2025)**

| ශ්‍රේණිය / தரம் / Grade | 09 | විෂයය / பாடம் / Subject | නාට්‍ය හා රංග කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 1 $\frac{1}{2}$ යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

## I කොටස

- **1 සිට 4 දක්වා ප්‍රශ්න සඳහා පහත දැක්වෙන උපුටා ගැනීම් පදනම් කර ගනිමින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

A. මෙලොවදී තව තව ලැබෙන්න

එලොවදී දුක නැතුව ඉන්න

දිව මාළිග පහළ වෙන්න

පිනට මුකුත් මට ලැබෙන්න

B. පයින් ඇවිදිල්ලා මහන්සිද මන්දා

ගොඩින් පැනගත්තා හුඟක් ළඟ හින්දා

C. ඒ උනාට මිනිහෙක්ට නිදිමතේ පුලුවන්ද හැමදාම රටක් පාලනය කරන්න?

D. තව පොඩ්ඩෙන් මත් බොහොම වැදගත් දෙයක් කියනවා. කවුද මේ ජනේලය වැහුවේ?

E. දුටු දුටු තැන සිනහවෙවී - කුල භේදය නොසලකාවී.

සැඩොල් කුලය ඉපදුන මට - වනයේ මල් මුහුණ දේවී

1. සත්ත්ව චරිතයක් ප්‍රධාන චරිතය ලෙස නිරූපණය වන නාට්‍යයක අඩංගු සංවාද ඛණ්ඩය ඇතුළත් වන්නේ,

   i. A ය.   ii. B ය.   iii. C ය.   iv. E ය.

2. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර විසින් නිර්මාණය කරන ලද නාට්‍යයක ඇතුළත් සංවාද ඛණ්ඩයක් වන්නේ,

   i. A ය.   ii. B ය.   iii. E ය.   iv. D ය.

3. සුභ සහ යස නාට්‍යයේ සංවාද ඛණ්ඩයක් ඇතුළත් අක්ෂරය වන්නේ,

   i. E ය.   ii. B ය.   iii. C ය.   iv. D ය.

4. ආකාස මහත්තයාගේ චරිතය ඇතුළත් නාට්‍යයේ එන සංවාද ඛණ්ඩයක් වන්නේ,

i. A ය. ii. E ය. iii. C ය. iv. D ය.

- **අංක 5 සිට 10 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

5. තල් ගොබයේ පත් ඉරුවල දේව ආරාධනය ලියා, සරසනු ලැබූ කත් ලීයක දෙපස රඳවා පෙරහැරින් ගෙන යනු ලබන පූජා කර්මය වන්නේ,

i. ආලවක දමනය ය. ii. දොරකඩ අස්න ය.

iii. මිලින්ද ප්‍රශ්නය ය. iv. පිරිත් පින්කම ය.

6. නිවසේදී සරම සහ කමිසය රැකියා ස්ථානයේදී කලිසම සහ කමිසය පන්සලේදී සුදු පැහැ කමිසය සහ සරම ඇඳ රූපණයේ යෙදිය හැකි චරිතයක් වන්නේ,

i. කුඩා දිලංක ය. ii. මහලු සිරිපාල ය.

iii. ළමා හර්ෂ ය. iv. ළදරු නිම්සර ය.

7. රන්තලියක් බව හඳුනා ගැනීමෙන් කච්ඡපුට වෙළෙන්දා ගැටලුවකට මුහුණපායි. මෙය,

i. පුද්ගලයා සහ පුද්ගලයා අතර ගැටුමකි.

ii. පුද්ගලයා සහ මනස අතර ගැටුමකි.

iii. පුද්ගලයා සහ සමාජය අතර ගැටුමකි.

iv. පුද්ගලයා සහ අදෘශ්‍යමාන බලවේග අතර ගැටුමකි.

8. මනමේ නාට්‍යයේ ප්‍රධාන චරිතය වූ මනමේ කුමරියගේ චරිතය සඳහා රංගනයෙන් දායක වූයේ,

i. මාලනී රණසිංහ ය ii. ට්‍රිලීෂියා ගුණවර්ධන ය

iii. සෝමලතා සුභසිංහ ය. iv. රම්‍යා වනිගසේකර ය.

9. බෞද්ධ හා කිතුණු ආගම්වල කතා පුවත් ඇසුරෙන් නිර්මාණය **නොකරන** ලද නාට්‍ය නිර්මාණයක් වන්නේ,

i. කදා වළලු ය. ii. සාන්තුවර සෙබලාණෝ ය.

iii. වෙස්සන්තර ය. iv. එලොව ගිහින් මෙලොව ආවා ය.

10. සිංහබාහු නාට්‍යයේ ආරම්භක වකවානුවේ සිංහයාගේ චරිතය නිරූපණය කළ රූපණ ශිල්පියා වන්නේ,

i. ජයනාත් බණ්ඩාර ය. ii. එඩ්මන් විජේසිංහ ය.

iii. නිශ්ශංක දිද්දෙනිය ය. iv. මාක් ඇන්ටනි ප්‍රනාන්දු ය.

- **11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා පහත වරහන් තුළ ඇති වචන අතුරින් සුදුසු වචනය තෝරා හිස්තැන් පුරවන්න.**

11. චරිතයක් අනුකරණය කිරීමේදී ………………………….භාවිත වේ.
12. සාර්ථක පෙළ රචනයක් සඳහා ……………………….. උපයෝගී කොට ගනී.
13. නාට්‍ය පෙළ ……………………………… ලියවිල්ලකි.
14. නළුවාගේ රංගය වඩාත් තීව්‍ර කරලීම සඳහා …………………………… වැදගත් මෙහෙයක් ඉටු කරයි.
15. සකස්කඩ නොකී කට - උඹේ කට හුඹස් කට

    සකස්කඩ කියූකට - ……………………………..

(සතර අභිනය, නිර්මාණාත්මක චින්තනය, ආනුෂංගික අංග, නුඹේ කට වටී රට, නාට්‍යෝචිත බව, සාහිත්‍යමය)

- **හිස් තැනට සුදුසු වචනය, ඉදිරියේ දැක්වෙන වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

16. කදා වළලු නාට්‍යයේ අතීත තොරතුරු හෙළිදරව් කරනු ලබන්නේ …………………… මගිනි. (කච්ඡපුට, අතීත වක්තෘ, පොතේ ගුරු)
17. සෝමලතා සුබසිංහ මහත්මිය සරා ලෙස ප්‍රධාන චරිතය නිරූපණය කළ ගුණසේන ගලප්පත්ති මහතාගේ වේදිකා නාට්‍යයක් වන්නේ ……………………………. ය. (මූදු පුත්තු, නරි බෑනා, තලමල පිපිලා)
18. චරිතයක අභ්‍යන්තර හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා ………………………….අභිනය බෙහෙවින් උපකාරී වේ. (වාචික, ආහාර්ය, සාත්වික)
19. චරිතයක් නිරූපණය කිරීමේදී ඒ ඒ අවස්ථාවට උචිත පරිදි විවිධ භූමිකාවන්ට …………………… විය යුතුය. (සමාරෝපය, ආරෝපණය, සහභාගි)
20. කදා වළලු නාට්‍යයේ …………………………… ප්‍රබල නාට්‍යෝපකරණයක් ලෙස භාවිත කරයි.

    (හබල, රන් කහවණු, රන්තලිය)

(20 x 1 = 20)

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න තුනකට පමණක් පිළිතුරු සපයන්න.

1) i. කච්ඡපුට යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 2)

ii. කච්ඡපුට වෙළෙන්දාගෙන් පිළිබිඹුවන බෝසත් ගුණ දෙකක් ලියන්න (ලකුණු 2)

iii. කදා වළලු නාට්‍යයට පසුබිම් වූ ජාතක කථා වස්තුවෙත් නාට්‍යයේ දැක්වෙන කතා වස්තුවෙත් දක්නට ලැබෙන සමානකම් දෙකක් ලියන්න. (ලකුණු 2)

iv. මෙම නාට්‍යයේ සිටුදුව හා මිත්තණිය ජීවත් වූ නගරය කුමක්ද? (ලකුණු 2)

v. මෙම නාට්‍යයේ නාට්‍ය දෘෂ්ටිය කුමක්ද? (ලකුණු 2)

vi. මෙම නාට්‍ය අයත් වන්නේ කුමන නාට්‍ය ශෛලියකටද? ඔබේ පිළිතුරු සනාථ කිරීමට උදාහරණයක් ලියා දක්වන්න. (ලකුණු 2)

2) i. ප්‍රධාන නාට්‍ය ශෛලීන් දෙක නම් කරන්න. (ලකුණු 2)

ii. එම ශෛලීන් අනුව නිර්මාණය කරන ලද නාට්‍ය දෙක බැගින් ලියන්න. (ලකුණු 3)

iii. බොහෝ නාට්‍යවල මෙම ශෛලීන් දෙකම මිශ්‍රව පවතී. ඔබ නැරඹූ වේදිකා නාට්‍යයක් පදනම් කර ගෙන මෙම අදහස පැහැදිලි කරන්න. (ලකුණු 5)

3) i. පන්ති කාමරයේදී ඔබ විසින් කරන ලද රංග ක්‍රීඩා දෙකක් නම් කරන්න. (ලකුණු 2)

ii. ඉන් එක් රංග ක්‍රීඩාවක් කරන ලද ආකාරය පියවර ලෙස පැහැදිලි කරන්න. (ලකුණු 3)

iii. චරිතයක් නිරූපණය කිරීමේදී ඔබට රංග ක්‍රීඩා මගින් ලැබුණු අත්දැකීම් පිටුවහල් වූ ආකාරය විස්තර කරන්න. (ලකුණු 5)

4) i. ජන කතා දෙකක් ඇසුරෙන් 1961 වර්ෂයේදී නාට්‍ය නිර්මාණය කරන ලද නාට්‍ය අධ්‍යක්ෂවරයා කවුරුන්ද? (ලකුණු 2)

ii. එතුමා විසින් නිර්මාණය කරන ලද නාට්‍ය තුනක් නම් කරන්න. (ලකුණු 3)

iii. එතුමාගේ නාට්‍ය නිර්මාණ සඳහා මූලාශ්‍ර කරගන්නා ලද තේමා පිළිබඳ පැහැදිලි කරන්න. (ලකුණු 5)

5) නළපාන ජාතකය /තිලමුට්ඨි ජාතකය /වෙස්සන්තර ජාතකය/ යහපත් සමාරිතයාගේ කතාව / නාස්තිකාර පුත්‍රයාගේ කතාව. මින් ඔබ කැමති ආගමික කතාවක් පදනම් කරගෙන කෙටි නාට්‍යය පෙළක් රචනා කරන්න.

- සංවාද
- රංග විධාන
- නාට්‍යෝචිත අවස්ථා සහිතව පෙළ රචනා කළ යුතුය. (ලකුණු 10)